**සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම - 2017**

**--------------------------------------------------------------------------**

සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන්, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම

-------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලයේ") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණන මතය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිතිය අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණනය සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 කරුණු අවධාරණය

---------------------

මගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව, මූල්‍ය ප්‍රකාශනවල පහත සටහන් කෙරෙහි මගේ අවධානය යොමු කරමි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම උපකල්පනය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 2.5. ඉහත සටහනේ සඳහන් පරිදි, කොළඹ ග්‍රෑන්ඩ් හයට් ප්‍රතිව්‍යුහගත කිරීම (Divestiture) සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017 අගෝස්තු 01 දින (කැබිනට් තීරණය 17/1613/733/029) ලබා දී තිබුණි. එසේම, සමාගමේ ජංගම වගකීම් ජංගම වත්කම් රු.471,653,072 කින් ඉක්මවා ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල සටහන 20 ට අනුව ප්‍රාග්ධන වියදම් සඳහා වන බැදීම් 2017 දෙසැම්බර් 31 දිනට රු.25,887,629,779 කි. තවද, අතුරු ණයක් (Bridge Loan) ලබා ගැනීමට 2018 ජනවාරි 10 වන දින ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුව විසින් උපදෙස් දී ඇති අතර ඒ අනුව සමාගමේ වර්තමාන ද්‍රවශීලතා ගැටලුව විසඳීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 45.3 ක ණයක් ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.

අසම්භාව්‍ය බැරකම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල සටහන 21. ඉහත සටහනේ සඳහන් පරිදි, 2015 ජනවාරි 27 වන දින ප්‍රධානය කරන ලද අභ්‍යන්තර අලංකරණ කොන්ත්‍රාත්තුව 2015 මාර්තු 27 දින අවලංගු කිරීම නිසා ඉන්ටර්නා කන්ට්‍රැක් ස්පා (ඉතාලි) විසින් සමාගමට එරෙහිව බේරුම්කරණයක් (arbitration) ස්ථාපිත කර තිබුණි. (කොන්ත්‍රාත් වටිනාකම යුරෝ 28,869,372). ඉන්ටර්නා කන්ට්‍රැක් ස්පා (පුද්) සමාගම විසින් සිදු කරන ලද කාර්යයන් සහ කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේ ලාභය අහිමිවීම වෙනුවෙන් යුරෝ 20,552,242 ක් ඉල්ලා තිබුණි. බේරුම්කරණ කටයුතු මත දැරීමට සිදුවූ පිරිවැය ද ප්‍රතිපූරණය කිරීමට තවදුරටත් ඉල්ලුම් කර තිබුණි. 2017 සැප්තැම්බර් 29 දින බේරුම්කරණයෙන් ඉල්ලුම්කරුට යුරෝ 7,432,062.79 ක මුදලක් ප්‍රදානය කර ඇත. කෙසේ වෙතත්, ඉන්ටර්නා කොන්ට්‍රැක් ස්පා හි හිමිකම් විභාග කිරීමට හෝ තීරණය කිරීමට බේරුම්කරුට අධිකරණ බලයක් නොමැතිවීම මත ශ්‍රී ලංකාවේ ඉහත පිරිනමන ලද බේරුම්කරණය බලාත්මක කිරීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ ඉන්ටර්නා කන්ට්‍රැක්ත් ස්පා විසින් ගොනු කර ඇති ක්‍රියාමාර්ගයට සමාගමේ කළමනාකාරිත්වය අභියෝග කර තිබේ.

**2.1.2 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් අවශ්‍ය වන පරිදි, පහත කරුණු දක්වමි.

අ. විගණනයෙහි මතය සඳහා පදනම සහ විෂයපථය හා සීමාවන් ඉහත දක්වන පරිදි වේ.

ආ. මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල බවත් වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 අඛණ්ඩ පැවැත්ම**

කොළඹ ග්‍රෑන්ඩ් හයට් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017 අගෝස්තු 01 දින (17/1613/733/029 කැබිනට් තීරණය) ලබා දී ඇත. කෙසේ වෙතත්, ශේෂ පත්‍රයේ දිනය වන විට, ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර සමාගම විසින් ප්‍රතිව්‍යුහගත කරණයේ පරිපාලන ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර ව්‍යාපෘතියෙහි ආයෝජනය කිරීමට කැමැත්ත විමසීම කර ඇත.

2.2.2 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ අවසාන තොගය යටතේ ඇතුළත් කර තිබුණු රු. 34,922,805 ක් වටිනා වැඩබිමෙහි ඉතිරිව තිබුණු අමුද්‍රව්‍ය තොග සඳහා භෞතික සත්‍යාපනය සිදු කර නොතිබුණි.

**2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථාව පහත දැක්විණි.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, | |
| (i) 7.4.5 වගන්තිය | ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීම සඳහා වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය පත් කළ යුතු වුවද, සමීක්ෂණ මණ්ඩලය පත් කර නොතිබූ |

| | | |
|---|---|---|
| | | අතර 2012 සිට මේ දක්වා සත්‍යාපනය සිදු කර නොතිබුණි. |
| (ආ) | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරන චක්‍රලේඛය | සේවකයින්ගේ PAYE බද්ද රජය සතු ව්‍යවසායයන් විසින් නොදැරිය යුතු වුවද, ව්‍යාපෘති සේවා කළමනාකරුගේ වැටුප් හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීමේ ගාස්තුවන මත PAYE බද්ද වන රු.1, 293, 504 ක් සහ රු. 199,999 ක් අදාළ සේවකයින්ගේ ඉපැයීම් වලින් අඩු නොකර සමාගම විසින් දරා තිබුණි. |
| (ඇ) | 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත (නිසි පරිදි සංශෝධනය කරන ලද) | |
| | (i) 113 වගන්තිය | 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ස්වයං තක්සේරු කරන ලද කාර්තුමය ආදායම් බදු ගෙවීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නියමිත දිනට ගෙවා නොමැත. |
| | (ii) 120(අ) හා (ඇ) වගන්තිය | 2017 අප්‍රේල් සහ අගෝස්තු මාස සඳහා ගෙවිය යුතු PAYE බද්ද නියමිත දිනට හෝ ඊට පෙර සමාගම විසින් ප්‍රේෂණය කර නොතිබුණි. තවද, සේවා යෝජකයාගේ PAYE වාර්ෂික ප්‍රකාශය නියමිත දිනට හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) 4(1) වගන්තිය | PAYE බද්ද ගණනය කිරීමේදී වෙනත් ප්‍රතිලාභ ඇතුළත් කළ යුතු වුවද, ව්‍යාපෘති සේවා කළමනාකරුට ලබා දී ඇති මහල් නිවාස කුලී, ජලය, විදුලිය, දුරකථන, පිරිසිදු කිරීම යනාදිය ගෙවිය යුතු මාසික PAYE බදු ගණනය කිරීමේදී සලකා බලා නොතිබුණි. |
| (ඇ) | මුද්දර ගාස්තු (2006 අංක 12 දරන විශේෂ විධිවිධාන පනත) | මුද්දර ගාස්තු ව්‍යාපෘති සේවා කළමනාකරුගේ වැටුපෙන් අඩු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.15,518,955 ක බදුවලට පෙර අලාභයක් වූ අතර සමාගමේ ඉකුත් වර්ෂයේ අනුරූපී බදුවලට පෙර අලාභය රු.42,360,162 ක් වූයෙන් සමාගමේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.26,841,207 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

### 4.1.1 සැලසුම් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛහි 5.1 වගන්තියේ අවශ්‍යතාවය පරිදි සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.1.2 මෙහෙයුම් සහ සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයකට අනුව, සමාගම විසින් 2011 දෙසැම්බර් 21 වන දින කොළඹ හෝටල් ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා සංස්ථාගත කර තිබුණද, කොළඹ හයට් රීජන්සි හෝටලයේ ආයෝජනය කිරීම සඳහා කැබිනට් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. 2015 මාර්තු මාසයට පෙර සිදු කළ මූලික පරිපාලන ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අදාළව වැඩිදුර සාක්ෂි ලබා දී නොතිබුණි.

(ආ) මීට පෙර සිටි සියලුම අධ්‍යක්ෂවරුන් 2015 ජනවාරි 20 වන දින ඉල්ලා අස්වී තිබුණු අතර 2015 පෙබරවාරි 26 වන දින නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබුණි. ඒ අනුව, 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානවලට පටහැනිව, සමාගම අධ්‍යක්ෂ මණ්ඩලයක් නොමැතිව දින 6 ක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට හෝටලයේ කෙරීගෙනයන ප්‍රාග්ධන වැඩ රු. බිලියන 17 ක් වුවද හෝටල් ව්‍යාපෘතියේ ඉතිරි කොටස සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැතිවීම හේතුවෙන් කොළඹ ග්‍රෑන්ඩ් හයට් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2017 අගෝස්තු 01 දින අනුමැතිය ලබා දී ඇති අතර, එබැවින් ව්‍යාපෘති ආරම්භයේ දී නුසුදුසු සැලසුම් කිරීම් හේතුවෙන් සමාගමේ අරමුණු සාක්ෂාත් කරගෙන නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) සමාගමට අයත් රු.9,600,000 ක් වටිනා වාහනයක් 2015 අප්‍රේල් 30 වන දින මුදල් අමාත්‍යාංශයට භාර දී තිබුණු අතර ලැබිය යුතු වාහන කුලී ආදායම රු. 2,222,000 ක් 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. සමාගම විසින් පමණක් අත්සන් කරන ලද ලියවිල්ලක් ඉදිරිපත් කර තිබුණද, එම මුදලේ නිරවද්‍යතාවය සංසන්දනය කිරීම සඳහා වලංගු සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) තවද, වාහනය 2017 මාර්තු මාසයේදී යළිත් සමාගමට භාර දී ඇති අතර 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයෙහි උපදෙස් අනුගමනය නොකර 2017 දෙසැම්බර් 06 දින එය අපහරණය කර තිබුණි.

(ඇ) නිසි තොග පාලන පද්ධතියක් පවත්වා නොතිබුණු අතර සමාගම විසින් කලින් කල භෞතික තොග සත්‍යාපන සිදු කර නොතිබුණි.

(ඈ) කොන්ත්‍රාත් කළමනාකරණයේ අකාර්යක්ෂමතාවයන් හේතුවෙන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන එකතු වටිනාකම රු. 5,832,029,710 ක් වූ කොන්ත්‍රාත් 15 ක කාල සීමාවන් දීර්ඝ කිරීමට සිදුව තිබුණි.

(ඉ) අභ්‍යන්තර අලංකරණ කොන්ත්‍රාත්තුව (යුරෝ 28,869,372) ප්‍රදානය කරන ලද ඉන්ටර්නා කන්ට්‍රැක් ස්පා (ඉතාලිය) සමාගම එකී කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම සඳහා සිංගප්පූරුවේදී අංක. 21266 /CYK / PTA යටතේ බේරුම්කරණ නඩුවක් පනවා තිබුණු අතර කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමේ පිරිවැය හා ලාභය අහිමිවීම, සිදුකළ වැඩවල පිරිවැය ලෙස රු. බිලියන 3.6 ක් (යුරෝ 20,552,242) ඉල්ලුම් කර ඇත. එසේම, ඉහත සඳහන් බේරුම්කරණ තීරණය ශ්‍රී ලංකාවේ බලාත්මක කිරීමේ අරමුණින් කොළඹ වාණිජ මහාධිකරණයේ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමට එරෙහිව ඉහත සමාගම විසින් අංක. CHC (සිවිල්) 619/2017 / ARB යටතේ නඩු පවරා තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනැති ශේෂපත්‍ර දිනට නඩු ඇසීමේ කටයුතු සිදුකෙරෙමින් පැවතුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**
------------------------------------

2014 අප්‍රේල් 14 දින ව්‍යාපෘති සේවා කළමණාකරු බඳවාගෙන තිබුණද, මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**
------------------------------------------

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2003 ජූනි 02 දිනැති අංක. පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 වගන්තියට අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර

විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2017 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 26 දින ඉදිරිපත් කර තිබුණි.

### 6.2 අයවැය පාලනය

------------------

2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.2.5 වගන්තියට අනුව යාවත්කාලීන කරන ලද වාර්ෂික අයවැය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති වෙත යවා නොතිබුණි.

### 6.3 විගණන කමිටු

----------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 7.4.1 වගන්තියට අනුව, රාජ්‍ය ව්‍යාපාර සඳහා විගණන කමිටු අවම වශයෙන් මාස තුනකට වරක්වත් රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

### 6.4 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

2006 රජයේ ප්‍රසම්පාදන පටිපාටියට අනුව සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 7. පද්ධති සහ පාලන

---------------------

විගණනය අතරතුර නිරීක්ෂණය කරන ලද පද්ධති සහ පාලනයේ අඩුපාඩු වරින් වර සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් අවශ්‍ය වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|
| (අ) ඉන්වොයිසි නිකුත් කිරීම | ඉන්වොයිසි නිකුත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම. |
| (ආ) තොග කළමනාකරණය | තොග ගබඩා කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. |
| (ඇ) බැංකු සැසඳුම් | බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් නොකිරීම. |
| (ඈ) ප්‍රසම්පාදන | සමාගම භාණ්ඩ හා සේවා සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවක් නඩත්තු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | | මිලදී ගැනීමේ ඉල්ලීම්පත් සහ ගෙවීම් වවුචර අනුපිළිවෙලින් නඩත්තු නොකිරීම. |
| (ඉ) | ජ'නල් සටහන් තැබීම | අනුමැතිය ලබා ගැනීමට පෙර ජ'නල් සටහන් ගිණුම්කරණ පද්ධතියට ඇතුලත් කිරීම. |